<u>**හමුදා සම්බන්ධීකරණ අංශය**</u>

**හමුදා සම්බන්ධතා නිළධාරි කාර්යාලය විසින් සිදුකරනු ලබන රාජකාරීන්**

1) ත්‍රිවිධ හමුදා උත්සව කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාල අනුමැතිය සහ සහය ලබාදීම.

2) රාජ්‍ය උත්සව කටයුතු සඳහා අවැසි සහයෝගය සහ සම්බන්ධීකරණය ලබාදීම (රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති සියළු උත්සව කටයුතු (State Funeral) ඇතුළුව විජයග්‍රහණ පෙළපාලිය (Victory Parade) සඳහා වූ ආරාධනාපත් සැකසීම.

3) විදේශ අමුත්තන්, රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ සම්බන්ධීකරණය කිරීම සහ සහයෝගය ලබාදීම.

4) ත්‍රිවිධ හමුදාවන් ගේ විවිධ අවශ්‍යතා සඳහා ඒ ඒ අමාත්‍යාංශ/ආයතන හා සම්බන්ධතාවයෙන් කටයුතු කර එම අවශ්‍යතාවයන් සපුරාදීමට කටයුතු කිරීම.

5) විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනයන් ගේ අවශ්‍යතා සඳහා ත්‍රිවිධ හමුදා දැනුම හා සම්පත් භාවිතා කරමින් ඇවැසි සහාය ලබාදීම හා සම්බන්ධීකරණය කිරීම(පුහුණු කටයුතු/ ඉඳුම් හිටුම් පහසුකම/ විවධ උපකරණ තාවකාලිකව ලබාගැනීම).

6) ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වල සේවයේ යෙදී සිටින විදේශීය ආරක්ෂක උපදේශකයින්/ සම්බන්ධීකාරකයින් (රටවල් 11 ක් නියෝජනය වන පරිදි 15 දෙනෙකු පමණ) සමගින් හමුදා ආධාරක වැඩසටහන් මෙන්ම මාස දෙකකට වරක් පැවැත්වීමට කටයුතු කිරීම.

7) ත්‍රිවිධ හමුදා මූලස්ථාන වෙත දේශීය/විදේශීය අයවළුන් ඇතුල්වීම සඳහා අනුමැතිය ලබාදීම සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි/ ත්‍රිවිධ හමුදාධිපති වරුන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් හමුවීම/සාකච්ඡා කිරීම සඳහා අවසරය ලබාදීම.

8) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි මෙන්ම ත්‍රිවිධ හමුදාපතිවරුන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් විවිධ උත්සවයන් සඳහා සහභාගිවීම හා විදේශීය තාන්ත්‍රිකයින් විසින් පවත්වනු ලබන ප්‍රිය සම්භාෂණ/උත්සව සඳහා සහභාගීවීම සඳහා වූ අනුමැතිය ලබාදීම හා ත්‍රිවිධ හමුදා නිලධාරින් හමුදා නොවන උත්සව අවස්ථාවන්හි ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගිවීමේදී සහ එකී උත්සව අවස්ථාවන් නියෝජනය වන පරිදි නිල ඇඳුමින් සහභාගිවීම සඳහා ඒඒ සේවාවන් විසින් ඉල්ලා සිටින විටදී අනුමැතිය ලබාදීම.

9) අමාත්‍යාංශයේ පැවැත්වෙන හමුදා රැස්වීම්/ සාකච්ඡා/ දේශණ සංවිධානය කිරීම හා සියළුම සාකච්ඡා/ රැස්වීම් සඳහා සහභාගී වන අයවළුන් හට සංග්‍රහ කිරීමේ කටයුතු.

10) නියමිත කාලසටහනට ධාවනය නොවන විදේශීය නාවික යාත්‍රා/ගුවන් යානා වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශණ ලබාදීම (Diplomatic Clearance) විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම කරනු ඇත.

11) ආරක්ෂක හමුදාවන්ට අදාළ ආනයනය කර ඇති භාණ්ඩ රේගුවෙන් මුදා ගැනීම සහ වෙනත් පුද්ගල/ආයතන වෙනුවෙන් ආනයනය කරනු ලබන කැමෝ රෙදි (කැමෝ රෙදි ආනයනය/ නිෂ්පාදනය/ අපනයනය/ ප්‍රවාහනය) රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් ගෙනදිය හැකියැයි සැලකෙන සියළු උපකරණ, ගුවන් යානා උපකරණ ්බෝට්ටු එංජින් වැනි භාණ්ඩ රේගුවෙන් මුදාගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබාදීම.

12) රාජ්‍යත්‍රාන්තික ප්‍රභූවරුන් සඳහා ගුවන් පහසුකම් සලසාදීම සහ දෛනිකව නියමිතව ගමන් ගන්නා ගුවන් හමුදා ගුවන් යානා මගින් ගුවන් පහසුකම් සලසාදීම හා අමතරව හෙලිකොප්ටර් යානා වල අවශ්‍යතාවය සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු සිදුකිරීම.

13) අමාත්‍යාංශයට පැමිණෙන සියළු අමුත්තන්/වාහන පැමිණීමට අවසරය.

14) සිතියම්/ගුවන් සිතියම් ලබාගැනීම සඳහා සර්වේයර් ජනරාල් ඇමතීම.

15) සඳහිරුසෑය ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම.

16) අමාත්‍යාංශයට අනුයුක්තව සේවයේ යෙදී සිටින සියළුම ත්‍රිවිධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින් ගේ පරිපාලනමය කටයුතු සිදුකිරීම/ අමාත්‍යාංශයේ විවිධ අංශයන් සඳහා ත්‍රිවිධ හමුදා වෘත්තිය අයවළුන් ලබාදීම/මාරු කිරීම් කටයුතු සිදුකිරීම.

17) හමුදාවන්ට අයත් විවිධ ආයතන වෙතට විශේෂයෙන් අභිමංසල/රණවිරු සෙවණ, මිහිඳුසෙත් මැදුර ආදී තැන් වලට සිවිල් පුද්ගලයින්ගේ ගමන් ගැනීමට අනුමැතිය ලබාදීම ඔවුන් විසින් සිදුකරනු ලබන සංග්‍රහ කටයුතු පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය කර දීමට කටයුතු කිරීම.

18) කොළඹ නගරය අලංකරණය කිරීම මේ සඳහා වෙනම කාර්යලයක් Colombo City and Suburbs Cleaning and Beautification Unit (CCSCBU) රේනුකා ගොඩනැගිල්ලේ ස්ථාපිතකර ඇති.

19) අතිගරු ජනාධිපතිතුමා සහභාගීවන රාජ්‍ය උත්සව සඳහා අධිසහායක නිළධාරියකු ත්‍රිවිධ හමුදාවෙන් නම් කිරීමට කටයුතු කිරීම.

20) ආගමික සිද්ධස්ථාන/රජයේ වැදගත් ගොඩනැගිලිවල නඩත්තු/නව ගොඩනැගිලි ඉදිකිරීම ආදිය සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම. මෙහිදී ආලේ ගේ උපදෙස් මත කටයුතු කිරීම.

21) රජයේ හෝ වෙනත් ආයතන මගින් සිදුකරනු ලබන ජල ආශ්‍රිත ක්‍රීඩා/ගමන් බිමන් හා වෙනත් කටයුතු සඳහා නාවික හමුදා සහාය ලබාදීම. සහ ප්‍රදර්ශණ සංදර්ශන සඳහා ත්‍රිවිධ හමුදා කුටි සැපයීම.

22) රජයේ පාසල් වෙත උපදේශක සේවා සහාය ලබාදීම (තූර්ය වාදන/බාලදක්ෂ/දේශන සහාය ආදී වශයෙන්).

23) විදේශීය ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා විදේශීය හමුදාවන්ගේ පුහුණු කටයුතු සඳහා දිවයිනේ සංචාර සඳහා සම්බන්ධීකරණය කිරීම. (NDC/NDU/H1Comd) වැනි පාඨමාලාවන්.

24) අවස්ථානුකූලව ත්‍රිවිධ හමුදා තූර්ය වාදන කණ්ඩායම් ලබාදීම. (සියළු උත්සව සඳහා)

25) ගාලුමුවදොර පිටියේ කරනු ලබන සියළුම උත්සව සඳහා වරායේ අධිකාරියේ අනුමැතියට යටත්ව ආරක්ෂක තත්වය කෙරෙහි අනුමැතිය ලබාදීම.

26) රාජ්‍ය උත්සව සඳහා හමුදා සහාය ලබාදීම (නිදහස් දින පෙළපාලිය/රණවිරු සැමරුම් දිනය) හා පලාත් මට්ටමින් පැවැත්වෙන රණවිරු සැමරුම් උත්සව සඳහා අවැසි අනුමැතිය සේවා සහාය සහ භට පිරිස් ලබා දීම.

27) මියගොස් සිටින රාජ්‍ය නායකයින්ගේ ජන්මදින උත්සව සහ මියගිය දින සැමරුම් උත්සව වෙනුවෙන් (ගුණ සැමරුම් උත්සව) පැවැත්වෙන උත්සව අවස්ථාවන් සඳහා අවශ්‍ය බියුගල් වාදකයින් සහ අවශ්‍ය පරිදි ශිෂ්‍ය භට බලකා භට පිරිස් ලබාදීම.

28) ඩොක්යාඩ් සමාගම වැනි ආයතන වලින් නවීකරණය කරනු ලබන බෝට්ටු අපනයනය කිරීම සහ සීසෙල්ස් වැනි රටවල් වෙත මත්ස්‍ය කර්මාන්තය සඳහා බෝට්ටු රැගෙන යාම පිලිබඳව අවසරය ලබාදීම.(අවශ්‍ය ලියකියවිලි සනාථ කර ගැනීමෙන් අනතුරුව)

29) මයිලඩි වැනි වරායන් වලට පැමිනෙන නැව් වල භාන්ඩ බෑම සඳහා කම්කරුවන් වෙත ඇතුල් වීමට අවසරය ලබාදීම. නැව් වලට පැමිනීමට අවසර ලබාදීම මෙම අමාත්‍යාංශයට අදාල නැත.

30) ගාලුමුවදොර පිටිය සහ ප්‍රදීපාගාර පරිශ්‍රයේ සිදුකරනු ලබන ඡායාරූපගත කිරීම සහ ටෙලි නාට්‍ය චිත්‍රපට සඳහා රූගත කිරීම වලට අනුමැතිය ලබාදීම(ගුවනේ සිට සිදුකරනු ලබන ඡායාරූප ගත කිරීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයෙන් අනුමැතිය ලබාදෙනු ලැබේ.)

31) නිශ්කාෂණ ලබා දීම.- (De la Rue Lanka සමාගම)

32) වරායන් තුල සිදුකරනු ලබන හමුදාමය උපකරණ රැගත් නැව් අතර ට්‍රානසිට් ඉන් ට්‍රානසිට් කටයුතු සඳහා වන අනුමැතිය.

33) ආරකශක රාජ්‍ය අමාත්‍යතුමන් හා ආරකශක ලේකම්තුමාගේ ආරක්ෂක කටයුතු සම්පාදනය සඳහා සිදුකරනු ලබන පරිපාලනමය කටයුතු සහ ඔවුන් විසින ත්‍රිවිධ හමුදා මූලස්ථාන/ ආරක්ෂක සේනා මූලස්ථාන/ පුහුණු පාසල්/ සේනාංක/ බලසේනා රෙජිමේන්තු මූලස්ථාන ආදී ත්‍රිවිධ හමුදා කඳවුරු වල සිදුකරනු ලබන සංචාර සම්බන්ධකරණය කිරීම.

34) විශ්‍රාමික ජ්‍යෝෂ්ඨ නිලධාරීන විශ්‍රාම දිනෙන පසුව හමුදා කඳවුරු වෙත ගෙන්වා සම්මාන පෙළපාලි/ උත්සව භොජන සංග්‍රහ පැවැත්වීම සඳහා වූ අනුමැතිය ලබා දීම.

35) අමාත්‍යංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ වැඩමුළු/ සහද හමුවන්/ විනොද චාරිකා ත්‍රිවිධ හමුදා කඳවුරු තුල පැවැත්වීමේදී ඒ සඳහා අවශ්‍ය සැලසුම් සහය සහ ඒවා සම්බන්ධීකරණය කර දීමට කටයුතු කිරීම.

36) සෞඛ්‍ය අමාත්‍යංශය විසින් මාසයකට වරක් පමණ ඩෙංගු උවදුර වසන්කිරීමට කරනු ලබන විවධ වැඩසටහන් සඳහා ආරක්ෂක හමුදා සහය අපේක්ෂා කරන විටදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වෙත එම ඉල්ලීම යොමු කිරීම.

37) ශ්‍රී ලංකා ධීවරයින් ඉන්දියානු මුහුදු සීමාවේදී ඉන්දියානු ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත විට ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක විසින් නාවික හමුදාවට පිටපත් සහිතව මෙම අමාත්‍යංශය වෙත දැනුම් දුන් අවස්ථාවේදී ඒ බැව් විදේශ කටුතු අමාත්‍යංශය දැනුවත් කිරීම. ඉන්දියානු ධීවරයින් අනවසරයෙන් ශ්‍රී ලංකා මුහුදු සීමාවට පැමිණීමේදී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගත අවස්ථාවන්හිදී නාවික හමුදාව විසින් අමාත්‍යංශය වෙත පිටපත් සහිතව ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වෙත දැනුම්දීමක් සිදිකරනු ලබයි.

38) අමාත්‍යංශයේ හෙළි යානා පථය විවිධ අවශ්‍යතාවයන් සඳහා වෙන්කරගැනීමට අවශ්‍යවන අවස්ථාවන්හිදී ඒ ඒ සේවාවන් විසින් මෙම අමාත්‍යංශය අමතනු ලබන අතර ඒ සඳහා අනුමැතිය ලබාදීම සිදුකරනු ලැබේ.

39) ත්‍රිවිධ හමුදාවන්ට අවශ්‍ය අමතර කොටස් න/ ආම්පන්න විදේශීය මිලදී ගැනීම සඳහා වූ රෙගු නිෂ්කාශන අනුමත කිරීම අත්සන් කිරීම.

40) චිත්‍රපට රූගත කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම ත්‍රිවිධ හමුදා ඇඳුම් ආයිත්තම්/ යාන වාහන ඇතුලත්ව කරනු ලබන දර්ශණ සහ ත්‍රිවිධ හමුදා වතගොත ඇතුලත් දර්ශණයන් වෙතොත් සහ හමුදා කඳවුරුතුල කරනු ලබන රූගත කිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම.

41) විවිධ උත්සවයන් සඳහා ආරක්ෂාව ලබාදෙනු ලබන ලෙස කරනු ලබන ඉල්ලීම් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

42) මාධ්‍ය මධ්‍යස්ථානයේ අවශ්‍යතා සහ ඔවුන් විසින් මාධ්‍ය ප්‍රචාර ලබාදීම සම්බන්ධයෙන් හමුදා සම්බන්ධතා නිළධාරිගේ අනුමැතිය අපේක්ෂා කර අවස්ථාවන්හිදී ඒ සදහා අනුමැතිය ලබාදීම.

43) ත්‍රිවිධ හමුදා ප්‍රදර්ශණ කුටි ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම්.

44) විවිධ පුද්ගලයින්ගේ වෙළඳ ව්‍යාපාර නිෂ්පාදන ආරක්ෂක අයවලුන් අතරේ අළෙවි කිරීමට කරනු ලබන ඉල්ලීම ත්‍රිවිධ හමුදාපතීන් වෙත යොමු කිරීම.

45) ආරක්ෂක හමුදාවන්ට අදාල පැමිණිලි/ඉල්ලීම් පිළිබඳ විවිධ පුද්ගලයින් විසින් කරනු ලබන විවිධ ඉල්ලීම් පිළිබඳ සුදුසු පරිදි කටයුතු කිරීම.

46) ත්‍රිවිධ හමුදාවන් මගින් සුභසාධන කටයුතු පිණිස පවත්වනු ලබන සංදර්ශන/ලොතරැයිපත්/මෝටර් රථ ධාවන තරග ආදිය පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම.

47) ත්‍රිවිධ හමුදාවන්ගේ සුභසාධන කටයුතු පිණිස මුදල් උපයාගැනීමේ අරමුණින් පවත්වනු ලබන සංදර්ශණ/ ලොතරැයිපත්/මෝටර් රථ ධාවන තරග ආදිය පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම.

48) අමාත්‍යාංශයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීම.

49) හදිසි අපදාවන්හිදී ආපදා කලමණාකරණ අමාත්‍යාංශය මගින් කරනු ලබන ඉල්ලීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

50) ආරක්ෂක ලේකම්තුමා හමුවීමට කරනු ලබන ඉල්ලීම ලේකම්තුමා වෙත ඉදිරිපත් කර අදාල දිනයන් හා වේලාවන් ලබාගෙන ඔවුන් දැණුවත් කිරීම(දේශීය/විදේශීය) ප්‍රභූවරුන් හමුදා ප්‍රධානීන් හා විවිධ තරාතිරමේ පුද්ගලයින්/ආයතන)